<u>නිපුණතා මට්ටම 10.2 - හවුල් ව්‍යාපාරයකට විශේෂිත වූ ගනුදෙනු විග්‍රහ කරයි.</u>

<u>නිපුණතා මට්ටම 10.3 - හවුල්කරුවන්ගේ හිමිකම් අනාවරණය කරයි.</u>

හවුල්කරුවෙකු විසින් හවුල් ව්‍යාපාරයකට දායකත්වය සැපයිය හැකි ආකාර	ලැබෙන ප්‍රතිලාභ	
1.ප්‍රාග්ධනය සැපයීම	ප්‍රාග්ධන පොලී	වියදම් ලෙස නොසලකන අතර ව්‍යාපාරයේ ලාභය බෙදා හැරීමක් සේ සැලකේ.
2.කළමනාකරණයට දායකත්වය දීම	වේතන	
3.අවදානම් දැරීම තුළින්	ලාභ කොටස	
4.ව්‍යාපාරයට ණය සැපයීම මගින්	ණය පොලී	ව්‍යාපාරයේ වියදමක් සේ සලකයි.

හවුල් ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හිමිකම ගණනය කිරීම සඳහා ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම පිළියෙල කිරීම අවශ්‍ය වේ.

1.ප්‍රාග්ධන ගිණුම -ස්ථාවර හිමිකම වාර්තා කරයි.
1.ප්‍රාග්ධන ගිණුමේ ආරම්භක ශේෂය
2.අතිරේක ප්‍රාග්ධනය
3.එකඟතාව මත ප්‍රාග්ධන ආපසු ගැනීම්

2.ජංගම ගිණුම -චිචල්‍ය හිමිකම වාර්තා කරයි.
1.ප්‍රාග්ධන පොලී
2.හවුල් වේතන
3.ගැනිලි
4.ලාභ කොටස්/අලාභ කොටස්
5.හවුල්කරුවන් සපයා ඇති ණය සඳහා පොලිය
6.හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් දරා ඇති ව්‍යාපාර වියදම්

1. හවුල් ව්‍යාපාරයක මුළු හිමිකම ගණනය කරන්නේ කෙසේද?
2. බාහිර පාර්ශ්ව විසින් සපයා ඇති ණය හිමිකමක්ද?වගකීමක්ද ?